සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

5384

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිතුමා **හීන් නූල්කාරයෙකු** බව සාමාජිකයෝ පැවසූහ.
(1) කම්මැළියෙකු (2) උපායෙහි දක්ෂයෙකු (3) මසුරෙකු (4) අහිංසයෙකු

02. ඇතැම් සේවකයෝ තමන් අවංක ව වැඩ කරන බව පෙන්වා **ලකුණු දමා ගැනීමට** උනන්දු වෙති.
(1) ප්‍රශංසා ලැබීමට (2) ජය ලැබීමට (3) නිදහසේ සිටීමට (4) උසස්වීම් ලැබීමට

03. **නය හතර දැනගත් දා සිට** අයියා පවුලේ යහපත වෙනුවෙන් කටයුතු කළේ ය.
(1) ගණිත් ඉගෙන ගත් දා සිට (2) අකුරු ඉගෙන ගත් දා සිට
(3) හොඳ නරක වටහා ගත් දින සිට (4) සමාජයට ගිය දින සිට

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. භාෂාවේ .................. උපයෝගී කර ගත් මිනිසා ජීව ලෝකය මෙන් ම ද්‍රව්‍ය ලෝකය ද පාලනය කිරීමේ හැකියාව ලබා ගෙන ඇත.
(1) සංකුලතා (2) විෂමතා (3) විචල්‍යතා (4) විභවතා

05. බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ දීර්ඝායුෂ්ක ජීවිතය සම්බුද්ධ ශාසනයේ ....................... පරමාදර්ශයකි.
(1) චිරස්ථිතියට (2) ආගමනයට (3) විවිධත්වයට (4) සංකලනයට

06. බොහෝ අපූර්ව නිර්මාණ බිහිවන්නේ නිර්මාණකරුවාගේ ......................... ප්‍රතිභාව හේතුවෙනි.
(1) ප්‍රාසාංගික (2) ආකස්මික (3) වෛකල්පිත (4) නෛසර්ගික

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මුලාශ්‍රය, නිත්‍යානුකූල, සමුලුව, දෘෂ්ඨිය (2) පර්යේශණය, දුර්භික්ශය, කුණාටුව
(3) ප්‍රස්තුතය, ප්‍රහර්ෂය, පරිහරණය, අභ්‍යවකාශය (4) සමස්ථ, උපයුක්ථ, නිරීක්ෂණය, බන්ධණය

08. රුස්ස, රුදුරු, තුලනය, වැයම යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) දීර්ඝ ඇදපිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ පාපිල්ල
(2) දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල
(3) කෙටි ඇදපිල්ල, ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල
(4) කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල



EXAMRESULTS.LK
CamScanner

09. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.

(1) රක්වාන, රත්ගම, රත්තොට, රත්නපුරය (2) මීමුරේ, මීතොට, මීගමුව, මීරිගම

(3) මාරවිල, මාදම්පේ, මාතර, මාතොට (4) දෙනියාය, දෙනගමුව, දෙහිවල, දෙල්තොට

10. කණ්ඨ ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අ,ආ,ඇ (2) එ,ඒ,ඔ (3) ඔ,ඕ,ඖ (4) එ,ඒ,ඓ

11. වේදිකාවෙහි ගී ගැයූ දූරියගේ මිහිරි ගායනයෙන් සතුටට පත් වූ රසිකයෝ මල්වරසන් දුන්හ. යන වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් විභක්ති වර්ගය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කරණ විභක්තිය, ප්‍රථමා විභක්තිය (2) අවධි විභක්තිය, සම්බන්ධ විභක්තිය

(3) ප්‍රථමා විභක්තිය, කර්ම විභක්තිය (4) ආධාර විභක්තිය, ප්‍රථමා විභක්තිය

12. දේවපූජා, මුවකමල යන පද අයත් වන්නේ,

(1) අව්‍යය සමාසය හා විභක්ති සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසය හා අව්‍යය සමාසය ය.

(3) විශේෂණ සමාසය හා දකාරාර්ථ සමාසයට ය. (4) විභක්ති සමාසය හා විශේෂණ සමාසයට ය.

13. ප්‍රමාණ + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රමාණික (2) ප්‍රාමාණික (3) ප්‍රාමණික (4) ප්‍රමණික

14. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) උපසර්ග - නිර්මිත, උද්ගාමී, ප්‍රතිකර්ම, විභේද (2) කෘදන්ත - බැලූ, සරන, ඇසුණු, පිසමන්

(3) තද්ධිත - ඉහළ, නූතන, සවිමත්, කඩිති (4) පූර්ව ක්‍රියා - ගොස්, බලන, දක, පවසා

15. මුලින් දී ඇති පදයේ සමානාර්ථය නො දෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) උදුල - බබළන, දිප්ත, දිලි, භූෂණ (2) සුළඟ - මරු, අනල, පවන, සමීර

(3) සිංහ - මෘග, මිගා, ඇත්රුපු, සිහ (4) ඇත් - හස්ති, වරණ, ගිජිඳු, ගජ

16. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ප්‍රවාදය - අනුවාදය (2) ගෘහස්ථ - ප්‍රව්‍රජිත

(3) සංකෝචනය - විස්තාරණය (4) ආධ්‍යාත්මික - භෞතික

17. එක් එක් පේළියේ දක්වා ඇති පදවල අර්ථය නිවැරදි ව ඇති වරණය තෝරන්න.

(1) නිසඹු - නියමිත, පබල් - ප්‍රසිද්ධ, ආවෘත - වැසුණු, ගොන්ගේ - ගවගාල

(2) සමසක් - මාස හයක්, අග්‍රස්ථය - ඉහළ භාගය, සියත් බව - ස්වීයත්වය, වෙහෙල් - මුව

(3) විරල - බොහෝ, අස්වත්ත - වනය, අනුරූප - උපමා සහිත, බූජ - දිනූ

(4) අවිනෂ්ට - විනාශ වූ, ක්ෂුද්‍ර - කපටි, කලවැල් - අගිල්, ශ්වේත - කළු

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) තිරිඟු, බාර්ලි, උඳු,මුං (2) ජම්බු, පේර, අඹ, අන්නාසි

(3) ඉදල, පිහිය, පැන, පැදුර (4) නිවිති, තම්පලා, සාරණ, ගොටුකොළ

19. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) විසර්ගය පූර්ණ නාසික්‍ය අක්ෂරයක් වේ.

(2) අන්තඃස්ථාක්ෂරවලට අනුගත ස්වර ශබ්ද ඇත.

(3) සියලු ම නාසික්‍ය අක්ෂර ඝෝෂ අක්ෂර වේ.

(4) සිංහල භාෂාවේ මහාප්‍රාණ අක්ෂර හමුවන්නේ පාලි හා සංස්කෘත භාෂාවලින් ගෙන ඇති තත්සම වචනවල පමණි.

20. අර්ථ විරහිත යුගල පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) වැර වෑයම්, ශුද්ධ පවිත්‍ර, වස විස, අබල දුබල

(2) බෙත් හේත්, පඩි නඩි, තක්කු මුක්කු, මුදල් හදල්

(3) ඇති නැති, අග මුල, එදා මෙදා, ගුණ දොස්

(4) නීති රීති, වට්ටි පෙට්ටි, කන කර, දුහි මඟි

21. සෑම පදයක ම මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) සාතිශය, ආරක්ෂාව, සුවිශේෂ, භෞමික (2) අභිරූපණ, මජ්ඣිම, අවස්ථාව, අධිරාජ්‍ය

(3) නුවණ, අකෘතඥ, සම්භාව්‍ය, අඹර (4) ඝ්‍රාණය, අඛණ්ඩ, ග්‍රීෂ්මය, සෘතුව



CamScanner

22. A. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා - බලත
B. මිශ්‍ර ක්‍රියා - සාදවයි
C. විධි ක්‍රියා - අස
D. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා - පායද්දී

A,B,C,D යටතේ දී ඇති ක්‍රියා වර්ග සම්බන්ධ ව නිවැරදි ගැළපුම වන්නේ,

(1) A හා C (2) B හා C (3) C හා D (4) A හා D

- අංක 23 සිට 25 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන පිළිතුර තෝරන්න.

23. සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවල කතා ඉදිරිපත් කිරීමේ දී පවසන කරුණු වඩා පැහැදිලි කිරීමට දෘෂ්ටාන්ත යොදා ගෙන ඇත.

(1) උපදේශ (2) උපමා (3) උදාහරණ (4) විස්තර

24. නූතන සාහිත්‍යාංගයක් වන නවකතා හා කෙටිකතා රචනයේ දී ලේඛකයෝ විඥානධාරා රීතිය භාවිත කරති.

(1) භාෂණ ව්‍යවහාරය (2) චරිත ලවා එම සිතුවිලි අනාවරණය කිරීම.
(3) කථන ක්‍රමය (4) සංක්ෂිප්ත ක්‍රම

25. දක්ෂ කථිකයා මාතෘකාවට අදාළ කරුණු සම්පිණ්ඩනය කොට ඉදිරිපත් කළේ ය.

(1) මනා ලෙස එකතු කොට (2) සාරාංශ කොට
(3) හොඳින් වෙන් කොට (4) සංතුලනය කොට

26. පහත දක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) ශ්‍රී මහා බෝධිය පැරණි ම අනුරාධපුරයේ ඓතිහාසික වෘක්ෂය ලෙස ඇත.
(2) අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා බොහෝ පාරිසරික ගැටලු උද්ගත වේ.
(3) දැනුම පමණක් ලබා දීමෙන් අධ්‍යාපනයෙන් රටට අවශ්‍ය ප්‍රවීණයන් බිහි වේ.
(4) දහනව වන සියවසේ සිංහලයෙන් මෙරටෙහි සිදු වූ සමාජ ආර්ථික පෙරළිය සාහිත්‍යයට බාධා සිදුවිය.

අංක 27, 28 යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

27. නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අපහසුතාවට පත්වීම.

(1) ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වගේ.
(2) කළුවා මාරපන් ගියා වගේ.
(3) ගමරාල සිල්ගත්තා වගේ.
(4) පරංගියා කෝට්ටෙ ගියා වගේ.

28. සුළු දෙයකින් වුවත් බලවත් විපතක් සිදුවේ.

(1) හිඟන්නාගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ. (2) කපන්න බැරි අත සිඹිනවා වගේ.
(3) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ. (4) ඔලිඳ ඇටෙනුත් ඇහැ කණ වෙනවා වගේ.

- A කර්මාන්ත .................... දියුණු කිරීම සඳහා රජය විධිමත් ක්‍රමවේදයන් සකස් කළ යුතු ය.
B සාහිත්‍ය උත්සවයේ දී ප්‍රවීණ ලේඛකයන් ........................ සම්මාන ප්‍රදාන කරන ලදී.
C මෙරට සෙල්ලිපි ලියා ඇති භාෂාවේ ස්වරූපය ...................... ඒවා මූලික ප්‍රභේද දෙකකට බෙදිය හැකි ය.
D ක්ෂණික ආහාරවලට පුරුදු වීමෙන් විවිධ රෝග සෑදෙන .................... වෛද්‍යවරු පවසති.

29. ඉහත එක් එක් වාක්‍යවල හිස්තැන් පිරවීමට වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ තෝරන්න.

(1) වෙනුවෙන්, නැවත, අනුව, බව (2) නැවත, වෙනුවෙන්, අනුව, බව
(3) අනුව, බව, වෙනුවෙන්, නැවත (4) බව, අනුව, නැවත, වෙනුවෙන්

අංක 30, 31 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

30. (1) ආධුනිකයෝ ගායන තරගයට සූදානම් වී ඇත.
(2) අධ්‍යක්ෂවරු ලිපිකරුවන් සමග රැස්වීමට සහභාගි වූහ.
(3) අපි නොහොත් ඔවුන් වැඩ කරති.
(4) ඔහු ආදර්ශවත් නායකයෙක් ලෙස කටයුතු කළේ ය.

31. (1) ගුවන් හමුදාවේ කාන්තාවන් ද ඇත. (2) සිසුහු වේලාසන පැමිණෙති'යි. ගුරුවරු සිතූහ.
(3) කලාකරුවෝ පස්දෙනෙකු සම්මාන ලැබූහ. (4) සියලු මිනිස්සු සමගියෙන් සිටිය යුත්තෝ ය.



CamScanner

32. පහත සඳහන් වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

"උදේ පාන්දර එයා කන්දෙන් පල්ලම් බහිනවා මම දැක්කා."

(1) උදෑසන ඔහු කන්දෙන් පහළට එනවා මම දක්කෙමි.

(2) උදෙන් ම එයා කන්දෙන් යනවා මා දක්කෙමි.

(3) උදේ ම ඔහු කන්දට යනවා මා දැක්කේ ය.

(4) උදෑසනම එයා කන්දෙන් පල්ලට එනවා මම දුටුවෙමි.

33. පහත දැක්වෙන ගීත යේ අවසාන කොටස නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

බුජ බල පළ කළ සුර නර විරු කැල
යළි හෙළ බිම ඉපදේවා
මුදු ගුණෙන් සුපුන් සඳ නැණින් ගුරුන් ලෙද
..............................................................................

(1) ජනතා දිනේ දිනේ! (2) සිවු දිග සැරසේවා! (3) රන්දිව හිනැහේවා! (4) සත සිත ගත සැනසේවා!

34. පෙරදිග ගොරහැඩි රකුසෝ
මගේ ධාන්‍යය ඇයි කඩන්නේ

ඉහත පද්‍ය කොටස ඇතුළත් පද්‍ය පන්තිය හා එහි රචකයා වන්නේ,

(1) වක්කඩ බඳිමු - ගුණදාස අමරසේකර මහතා (2) උදය - සිරි ගුණසිංහ මහතා

(3) අසත් පත්තිනි දේවතාවී - මොනිකා රුවන් පතිරණ (4) ගම අමතකයි - මහගමසේකර

35. 'සඳගිර' , 'කනේරු මල්' යන නාට්‍ය ලියූ රචකයා වන්නේ,

(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (2) හෙන්රි ජයසේන මහතා

(3) ජයලත් මනෝරත්න මහතා (4) සුගතපාල ද සිල්වා මහතා

36. නොවිතර තෙද බලැති මහතුන් හට පවර
වැරසැර නොවන නුනුවණ දන බඳිනු වෙර

මෙම පද්‍ය කොටසෙහි ඇති 'වැරසැර' යන්නෙහි අර්ථය වන්නේ,

(1) ඉතා දැඩි (2) කෝපයෙන් යුක්ත (3) බලයෙන් හීන (4) වීරසාර

37. "සවනක් ගන බුදු රැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් සියලු රසින් සැදෙත් සැදෙත්"

ඉහත ගද්‍ය කොටස ඇතුළත් සාහිත්‍ය නිර්මාණය කුමක් ද?

(1) පූජාවලිය (2) බුත්සරණ (3) අමාවතුර (4) සද්ධර්මරත්නාවලිය

38. රූපකයක් ඇතුළත් වන උත්තරය තෝරන්න.

(1) සිරිමත් සුපුන් සඳ වැනි වුවන මන නද

(2) සිකි පිල් සලන ගන නිල් වනේ

(3) සිරි සිරි හඬ නගා එයි මඳ සුළං හමා

(4) අමා ගඟ ගලාලා භවේ ගිනි නිවේවා!

39. රුහුණු උපභාෂාවේ 'බාලම්මා' යනුවෙන් හඳුන්වන්නේ,

(1) ලොකු අම්මා (2) පුංචි අම්මා (3) ලොකු අම්මා (4) ආච්චි

40. මුලින් දී ඇති පාඨයෙහි අදහස වඩාත් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

රසවින්දනය හා යහපත් විචාරයක යෙදීමට ඉදිරිපත් වන තැනැත්තා තුළ සාහිත්‍ය නිර්මාණ කියවීමේ පුරුද්දක් තිබිය යුතු ම ය.

(1) බොහෝ සාහිත්‍ය නිර්මාණ කියවීමට හුරු පුරුදු වී සිටින අය පමණක් රසවින්දනය කරති.

(2) රසවින්දනය හා විචාරය සාහිත්‍යකරුවන්ගේ ප්‍රධානතම කාර්යය වේ.

(3) සාහිත්‍ය නිර්මාණ කියවන්නාගේ රසවින්දනය හා විචාරය උසස් මට්ටමක ඇත.

(4) රසවින්දනය කිරීමටත් යහපත් විචාරයක යෙදීමටත් ඉදිරිපත් වන්නා බොහෝ සාහිත්‍ය නිර්මාණ කියවීම ඉතා වැදගත් වේ.

(ලකුණු 1×40 -40)

CS CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

5385

| ශ්‍රේණිය தரம் Grade | 11 | විෂය பாடம் Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය வினாத்தாள் Paper | II | කාලය காலம் Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් ඉරි ඇඳි අකුරුවල සංකේත/පිල්ලම් ලියන්න.
(අ) ප්‍රගමනය (ආ) රුවල

(ii) පහත සඳහන් පද නිවරදි ව විසන්ධි කර ලියන්න.
(අ) දුන්න (ආ) ළිංවතුර

(iii) ඔහු වහ වහා නිවසට ගොස් අදාළ සිද්ධිය පැල කරත් ම දෙමව්පියෝ එතැනට පැමිණියහ.
ඉහත දැක්වෙන වාක්‍යයෙහි ඇතුළත්,
(අ) පූර්ව ක්‍රියා පදයක් (ආ) අසමභාව්‍ය ක්‍රියා පදයක්
ලියන්න.

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
පැරණි කවීහු තම කාව්‍ය නිර්මාණ සඳහා එලිසමය යොදාගත්තේ රිද්මානුකූල ලෙස පද අමුනන රටාවක් සහෘදයා වෙත ඉදිරිපත් කිරීමට ය.
(අ) ................................ (ආ) ................................

(v) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) දරුවෝ තම අභිමතය පරිදි කටයුතු කරති'යි දෙමාපියෝ සිතූහ.
(ආ) මෙවර විභාගයට ඉදිරිපත් වූ සියලු ශිෂ්‍යයෝ මව්බස විෂයය සමත් වී ඇත.

(vi) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ඛණ්ඩ (ආ) ස්වාර්ථය

(vii) පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිවැරදි ව ලියන්න.
(අ) වැද (ආ) වැඳ

(viii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් තද්ධිත පදයක් සහ කෘදන්ත පදයක් ලියන්න.
මානව මූලික සමාජයන්හි ඇතැම් සිරිත් විරිත් හා ඇදහිලි විද්වතුන්ගේ විමසිල්ලට බඳුන් විය.
(අ) ................................ (ආ) ................................

(ix) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) ඇතැම් වෙළෙන්දෝ අවස්ථානුකූල ව භාණ්ඩවල මිල ඉහළ දමති.
(ආ) කම්කරුවා වැඩබිමට පැමිණි තම සේවාදායකයා හමුවිය.

(x) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) ඉතා කුඩා දෙයින් සතුටට පත් වන
(ආ) තමාට ම අයත් බව

(ලකුණු 2×10=20)



CamScanner

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) යම්කිසි රටක ආර්ථික රටාව එහි සංවර්ධනය කෙරෙහි සෘජුව ම බලපාන සාධකයකි. තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම ඕනෑ ම රජයක අරමුණයි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් මේ සඳහා සැලසුම් සකස් කිරීමේ දී විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කිරීමත් ඒ සඳහා විධිමත් ක්‍රමවේද අනුගමනය කිරීමත් කළ යුත්තේ ඉතා පරිස්සමෙනි.

(ආ) ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පිළිබඳ ව ලෝකවාසීන් දක්වන උනන්දුව ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. ක්‍රිකට් ක්‍රීඩාව ද ජාත්‍යන්තර අවධානයට ලක් වූ ක්‍රීඩාවකි. නමුත් ශ්‍රී ලංකාවේ අවධානය යොමු විය යුතු එක ම ක්‍රීඩාව ක්‍රිකට් පමණක් නොවේ. ඔලිම්පික් තරඟවල දී දක්ෂතා දැක්වීමට අදාළ වන ආකාරයේ ක්‍රමවත් සැලැස්මක් යටතේ දීපව්‍යාප්ත ක්‍රීඩා වැඩසටහන් නොපමා ව ආරම්භ කළ යුතු ය.

(ඉ) අපරාධ සම්බන්ධයෙන් වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින තත්ත්වය විවිධ මාධ්‍ය ඔස්සේ දැකගත හැකි ය. විවිධාකාර හේතු නිසා සිදුවන මේ අපරාධ වළක්වා ගැනීමටත්, වැරදිකරුවන්ට නිසි දඬුවම් ලබා දීමටත් ක්‍රියා නො කළ හොත් වැඩිකල් නො ගොස් මේ ධර්මද්වීපය අපරාධ ද්වීපයක් බවට පත්වනු ඇත.

(ඊ) වර්තමානය වන විට පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය ජන ජීවිතය හා බද්ධ වී ඇත. එහෙත් එය පීඩාකාරීවූත්, අහිතකරවූත් මට්ටමකට ළඟා වී ඇති බව නො රහසකි. මේ ව්‍යසනයෙන් වන හානිය අවම කර ගැනීමට එම නිෂ්පාදන තහනම් කිරීමට ද රාජ්‍ය මට්ටමින් කටයුතු යොදා ඇත. රජයෙන් තහංචි පැනවෙන තෙක් බලා නො සිට දේශීය අමුද්‍රව්‍යවලින් සැකසුණු විකල්ප නිෂ්පාදන සඳහා යොමුවීම ජාතික වගකීමකි.

(ලකුණු 25)

03. පහත සඳහන් පාඨය වචන 65 - 75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරයේ අග සඳහන් කරන්න.

අපට දැනට ඉතිරි ව ඇති පැරණි ම සිංහල කෘතිය වූ සියබස්ලකර වනාහි භාරතීය කාව්‍යාලංකාර කිහිපයක් සිංහලයට හඳුන්වා දීම සඳහා ගී විරිතින් ලියැවුණකි. මුල් ම සිංහල නිර්මාණාත්මක කාව්‍යයන් වූ සසදාවත, මුවදෙව්දාවත හා කව්සිළුමිණ යන කෘති ද ගී විරිතින් පබැඳිණි. එසේ ම එම කෘතිවල වස්තු විෂයටත් කාව්‍යාලංකාරවලටත් සියබස්ලකර මාර්ගෝපදේශයක් සපයා ඇත. සියබස්ලකරට මූලාශ්‍රය වූයේ 'දණ්ඩීන්' නම් සංස්කෘත කවියා විසින් රචිත කාව්‍යාදර්ශයයි. කාව්‍යාදර්ශය හයවන ශතවර්ෂයට අයත් සේ සැලකේ. කාව්‍යාදර්ශය අනුව යමින් එය සම්පාදනය වූයේ කාලීන අවශ්‍යතාවක් සපුරාලමින් විය හැකියි. විශේෂයෙන් ම ග්‍රන්ථයෙහි භාෂා ලක්ෂණ සැලකිල්ලට ගනිමින් දසවන සියවස මැද භාගයේ ලංකාව පාලනය කළ සිව්වන සේන රජතුමා විසින් මෙම කෘතිය කරවන ලද බව විද්වත් මතයයි.

සංස්කෘත කාව්‍යාදර්ශයේ පරිවර්තනයක් ලෙස බොහෝ දෙනා විසින් සලකනු ලැබුවත් එය මූලාශ්‍රයේ පූර්ණ පරිවර්තනයක් ලෙස සැලකීම යුක්ති සහගත නො වේ. කෘතිය සම්පාදනයේ දී බුද්ධදහම හා සබැඳි සිංහල සංස්කෘතිය හා සිංහල භාෂාව ගැන ද සැලකිලිමත් වූ බව පෙනේ. නමුත් කෘතියෙහි පෙළගැස්ම මූලාශ්‍රයට අනුව ගොස් ඇත.

මූලාශ්‍රයේ මෙන් ම මෙහි ද සර්ග තුනක් දක්නට ඇත. ප්‍රථම සර්ගයෙහි දෙව් බමුන් හා අලංකාර ආචාර්යවරුන් නැමදීමෙන් පසු ව කාව්‍ය ලක්ෂණ හා නිදර්ශන සහිත ව දශවිධ ප්‍රාණ දක්වා ඇත. දෙවන සර්ගයෙන් තිස්පහක් වූ අලංකාර ප්‍රභේද නිදසුන් දක්වමින් විස්තර කෙරේ. තුන්වන සර්ගයෙන් යමක ශ්ලේෂාදී විචිත්‍ර පද්‍ය බන්ධන හා කාව්‍ය දෝෂ දැක්වේ. මෙසේ අර්ථාලංකාර හා ශබ්දාලංකාර යන දෙවර්ගය ම බොහෝ විට නිදර්ශන සහිත ව ඉදිරිපත් කොට ඇතත් සිංහලයට නොගැළපෙන කාව්‍ය බන්ධන ඡන්දස් ආදියට නිදර්ශන සපයා නොමැත. භාෂාවේ භාවික ගුණය, සියත් බව ආදී විවිධාකාර අංග විමර්ශනයට ලක් වුව හොත් සිංහල භාෂාව පිළිබඳ ව අපට අභිමානවත් විය හැකි කරුණු රාශියක් මෙම කෘතිය මඟින් හෙළි වනු ඇත.

(ලකුණු 10)



CamScanner

04. **පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.**

ලෝකයේ සෑම ප්‍රදේශයක ම පාහේ තෙත්බිම් දක්නට ඇත. ලොව විශාලතම තෙත් බිම් පැතුරුම දකුණු බ්‍රසීලයේ පැන්තනාල් පිටාරතැන්න ප්‍රදේශයේ දී දැකගත හැකි ය. තෙත්බිමකින් අප ලබන ප්‍රයෝජන බොහෝ ය. උස්බිම් මත ඇද හැලෙන වැඩිපුර ජලය ගලා ඒමෙන් සිදුවන ගංවතුර විපත් පාලනය කිරීම මෙමගින් සිදු කෙරෙන වැදගත් ම කාර්යය ලෙස සැලකෙන අතර මෙමගින් භූගත ජලය ප්‍රතිෂ්ඨාපනය කිරීම ද සිදු කරයි. මේ හැරුණු විට ජෛව විවිධත්වයට ඒ තුළින් ඉටු කෙරෙන සේවය ද සුළුපටු නො වේ.

ශ්‍රී ලංකාවේ ද පළාත් ගණනාවක තෙත්බිම් පිහිටා ඇත. භූමි ලක්ෂණ හා විශේෂ වූ සාධක පදනම් කර ගනිමින් ඒවා ප්‍රධාන වශයෙන් මිරිදිය තෙත්බිම්, කිවුල්දිය තෙත්බිම් හා කරදිය තෙත්බිම් වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇත. දේශීය වශයෙන් ගත් කළ මෙරට තෙත්බිම් විවිධ වූ තර්ජනවලට මුහුණ පා ඇති බව පෙනෙයි. එනම් ශීඝ්‍රයෙන් සිදු කෙරෙන නාගරීකරණය හේතුවෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන ලෙස මෙවැනි වටිනා පරිසර පද්ධතීන් යොදා ගැනීමත්, තෙත්බිම් සතු මාහැඟි වටිනා සම්පත් විනාශ කර දැමීමත් මෙහි දී දක්නට ලැබේ. නිසි අවබෝධයක් නොමැතිකම නිසාත්, තෙත්බිම් නිසරුබිම් ලෙස සැලකීම නිසාත් මෙවැනි තත්ත්ව ඇති වේ. එහෙත් එය එසේ නොවන බව අප කවුරුත් මතක තබා ගත යුතු ය.

ලොව පුරා විසිරී පැතිරී ගිය අන්තර්ජාතික වශයෙන් වටිනාකමින් යුතු තෙත්බිම් හඳුනාගැනීම සහ ඒවා සංරක්ෂණය කිරීම අරමුණු කරගත් රටවල් කිහිපයක් එක් ව 1971 වසරේ දී ඉරානයේ රැම්සාර් නගරයේ දී සම්මුතියක් අත්සන් කරන ලදී. මෙය රැම්සාර් සම්මුතිය නමින් හඳුන්වන අතර එය 1975 දී ක්‍රියාත්මක වීම ඇරඹිණි. මෙමගින් කරුණු ගණනාවකට එකඟතාව පළ කොට ඇත. කෙසේ වුවත් මෙම පද්ධතිය ආරක්ෂා කර ගැනීමට ජාත්‍යන්තර වශයෙන් අවධානය යොමු වී ඇත්තේ ලොව මානව ශිෂ්ටාචාරයන් පවා මේ ඇසුරින් බිහි වී ඇති බැවිනි.

1. ලොව විශාලතම තෙත්බිම පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද?
2. දේශීය තෙත්බිම්වල ප්‍රධාන කොටස් තුන ලියන්න.
3. තෙත්බිමකින් සිදු කෙරෙන කාර්යයන් අතර ප්‍රධානතම කාර්යය කුමක් ද?
4. ඡේදයේ සඳහන් පරිදි මෙම පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති සංවිධානයේ නම කුමක් ද? එය ක්‍රියාත්මක වූ වර්ෂය කුමක් ද?
5. තෙත්බිම් ආරක්ෂා කිරීම පිළිබඳ ව ජාත්‍යන්තර අවධානය යොමු වී ඇත්තේ කවර හේතුවක් නිසා ද?

(ලකුණු 2×5=10)

05. කොළඹ නගරයට ආසන්නව පිහිටා ඇති සිරිපුර මහල් නිවාස සංකීර්ණය පවුල් තුන්සීයකට පමණ සෙවණ ලබා දෙයි. එහි නිවැසියන්ගේ පොදු අවශ්‍යතා සඳහා ප්‍රජා ශාලාවක් නොමැතිකම කලක පටන් ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. නිවාස සංකීර්ණය ඉදිකරන අවස්ථාවේ දී ම ඒ සඳහා නියමිත බිම් කොටසක් වෙන් කර ඇතත් මේ දක්වා එහි කටයුතු ආරම්භ වී නැත. එය ආරම්භ වූ විට නොමිලයේ ශ්‍රම දායකත්වය ලබා දීමට නිවාස සංකීර්ණයේ ක්‍රියාත්මක සුබසාධක සංගමය තීරණය කර ඇත. මෙහි ඉදිකිරීම් කටයුතු කඩිනම් කරන ලෙස ඉල්ලා පවතින තත්ත්වය ගැන ද දැනුවත් කරමින් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට යවන රාජකාරි ලිපිය ලියන්න. ඔබ එම සංගමයේ ලේකම් පසන් දිසානායක යැයි සිතන්න. (වචන 100 - 125ත් අතර සෑහේ.)

නැතහොත්

අලුතින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බතික් රෙදිවලින් නිමවූ විවිධ මාදිලියේ කාන්තා, පිරිමි, ළමා ඇඳුම් හා දේශීය විලාසිතා රැගත් වෙනත් ඇඳුම් පැළඳුම්වලින් සමන්විත අලෙවිසලක් තම ප්‍රචාරක කටයුතු සඳහා වෙළෙඳ දැන්වීමක් සකස් කරයි. ආරම්භක දිනය, විවෘත ව තැබෙන වේලාවන්, ලබා දෙන වට්ටම් සහ පවතින ලාභදායී මිල ගණන් ආදිය ද මෙහි සඳහන් විය යුතු ය. ඔබ එහි අලෙවි කළමනාකරු යැයි සිතා වෙළෙඳ දැන්වීම සකසන්න. (වචන 100 පමණ සෑහේ.)

(ලකුණු 15)



CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

5392

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි:-
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "තොප හා සම නුවණැති කෙනෙක් නම් නැති මෙසේ වූ මහා සේනාවෙන් අපට ගැලැවීමක් කෙසේ වේ ද?"

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙකු විසින් ද?

(ආ) මේ ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය ලියා ඇත්තේ කිනම් රජු දවස ද?

(ii) එක් උන දාට උක් දණ්ඩේ පැණි සේ මා
වෙන් උන දාට යක් දෙබරේ වද සේ මා
.............................................................
.............................................................

ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(iii) "සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා"

(අ) මේ පද්‍යය තුළ ප්‍රකාශ වන උපමා උපමේය උපුටා දක්වන්න.

(ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට පිලිපීනයෙන් ලැබුණු සම්මානය කුමක් ද?

(iv) "දින ගණනාවක් ම දුකට හා දොම්නසට ද සංවේගයට හා සන්තාපයට ද ගොදුරක්ව හඬා වැලපීම සිරිතක් වූයේ ය."

(අ) මෙහි සඳහන් පරිදි සංවේගයට හා සන්තාපයට පත්වූයේ කවුරුන් ද?

(ආ) මේ කොටස උපුටාගත් ග්‍රන්ථයේ රචකයා කවරෙක් ද?

(v) සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිදු බව පිනි බිඳෙහි
එක් වී මා පුතුගෙ ලෙහි
අරක් ගනී හැම දිනෙහි

(අ) කවියේ සඳහන් පරිදි පුතාගේ හදවත තුළ අරක් ගෙන ඇත්තේ මොනවා ද?

(ආ) මෙම කවිය උපුටාගත ග්‍රන්ථයෙහි රචකයා නම් කරන්න.

(vi) "බුදුහුත් දකුණත දික් කොට ලා 'මහණ, මෙසේ එව' යි වදාළ සේක."

(අ) මෙසේ බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කළේ කවුරුන්ට ද?

(ආ) මේ කොටස උපුටාගත් ග්‍රන්ථයට මූලාශ්‍ර ග්‍රන්ථය කුමක් ද?



CamScanner

(vii) පහත සඳහන් නිර්මාණවල රචකයින් නම කරන්න.
(අ) රුවන් කුමාරි කෘතිය (ආ) සද්දන්ත නාට්‍යය

(viii) දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

(අ) මේ කවියෙන් කියවෙන දෙදෙනා සමාන කර ඇත්තේ කාහට ද?
(ආ) මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය ලියූ යුගය නම් කරන්න.

(ix) "වන්දිමි හිමි වලා - තො ගොසින් ඇය නිවෙස්නට...."
(අ) මේ ගී පාදය උපුටාගත් මූලාශ්‍රය නම් කරන්න.
(ආ) සැළලිහිණි සන්දේශයේ නිමිත්ත අනුව අවසානයේ ආයාචනා කරන්නේ කවරෙකු වෙත ද?

(x) (අ) සිව්වන සේන රජතුමා විසින් රචනා කළ ග්‍රන්ථය නම් කරන්න.
(ආ) එම ග්‍රන්ථයට අනුවාදයක් ලෙස ලියූ ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 2×10=20)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "මේ මනුෂ්‍ය ලෝකයෙහි උපන් සත්වයන්ගෙන් ජඩ වූ යම් එකක්හු කළ මනා යම් නො කටයුත්තක් ඇති නම් ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයක් ඇද්ද?"
(අ) මේ කොටසෙහි සඳහන් වන නොකටයුතු සිදුවීම කුමක් ද?
(ආ) මේ කොටස ලිහිල් බසින් ලියන්න.

(ii) කුළින් කුළම සිහිල්'ඹ වෑහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙවතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු'පුල පඬෙරුය

(අ) මෙම කවියෙන් ප්‍රකාශ වන කැරගල ප්‍රදේශයේ ආර්ථික තොරතුරක් කෙටියෙන් සඳහන් කරන්න.
(ආ) කවියේ අවසාන පාදය ලිහිල් බසින් ලියන්න.

(iii) "එසඳ කොසොල් රජ බිය පත් වැ වෙවුලා ගියෙ තුබූ මහජනයා බිය පත් වැ කඩු පලඟ දමා පියා එ එ දසායෙහි පලා නුවර වැදූ දොර පියා-ලා අඟුළු ගෙනැ අටල්ලට නැඟී බලමින් සිටියාහු..."
(අ) මෙහි සඳහන් සිදුවීමට බලපෑ ආසන්නම හේතුව කෙටියෙන් දක්වන්න.
(ආ) මෙහි සඳහන් කොටසෙහි චිත්තරූප මවන එක සිදුවීමක් උපුටා දක්වන්න.

(iv) පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දූමුවෙන් ගුළි අහසට
කුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට

(අ) මේ කොටසින් ප්‍රකාශ වන අභව්‍ය සිදුවීම කුමක් ද?
(ආ) අංකිත පදවලට අරුත් සපයන්න.

(v) "ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව
ඇදි ඇදි ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය
දුෂ්කරය කියා හැර යා යුතු ද ජීවිතය?
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස"

(අ) මෙහි සඳහන් වන පරිදි ගඟට සජීවී බවක් එක් කළ අයුරු පෙන්වා දෙන්න.
(ආ) කවියෙන් ප්‍රකාශ වන ජීවිතයක යථාර්ථය කෙබඳු දැයි සඳහන් කරන්න. (ලකුණු 4×5=20)



CS CamScanner

3. • ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තව මහෞෂධ චරිතයත්,
• හාස්‍ය උපහාසයෙන් සේවට්ට චරිතයත්,
සජීවී චරිත ලෙස ජාතක කතාකරු උම්මග්ග ජාතකය තුළින් මතු කර ඇත. එක කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

සැළලිහිණි කවියා,
• තත්කාලීන සමාජ තොරතුරු
• ස්වභාවෝක්ති අලංකාරයෙන් වර්ණනා කිරීම රසවත් ලෙස ඉදිරිපත් කර ඇති ආකාරය 'මග විසිතුරු' පද්‍ය පන්තිය ඇසුරින් එක කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

4. • කථකයාගේ චරිතය
• මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ චරිතය කතාකරුගේ අත්දැකීම වඩාත් අර්ථවත් ව ඉදිරිපත් කිරීමට හේතු වී ඇති අයුරු 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

නැතහොත්

• රූපකාර්ථවත් යෙදුම් භාවිතය
• සංකේත උචිත ලෙස යොදා ගැනීම මගින් 'දෑතේ කරගැට සිඹ සනසන්නට' නිර්මාණයේ ශ්‍රමාභිමානය ඉස්මතු කිරීමට කවියා දක්වූ දක්ෂතාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 15)

5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පිළිතුරු සපයන්න.

5. ළමා මනසට දේශාභිමානී හැඟීම් දනවන අයුරින් අපූරු කාව්‍යාලංකාර යොදා ගැනීම කෙතරම් උචිත දැයි 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් පෙන්වා දෙන්න.
(ලකුණු 10)

6. රසවත් උපමා යොදාගැනීමත්, චිත්තරූප මවන සංකල්පනා යොදා ගැනීමත් නිසා 'උග්ගසේන නම් සිටුපුත්හුගේ කතාවස්තුව' රසවත් වී ඇති අයුරු උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

7. කුරහන් ගොවියාගේ ජීවිතය දුක සතුට ධ්වනිතාර්ථවත් පද භාවිතයෙන් ප්‍රකට වන අන්දම 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' කවි ඇසුරින් උදාහරණ **තුනක්වත්** ගෙන පැහැදිලි කරන්න.
(ලකුණු 10)



CamScanner

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2023**

**11 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය**

## I පත්‍රය පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 4 | 21 - 2 | 31 - 4 |
| 2 - 1 | 12 - 4 | 22 - 1 | 32 - 1 |
| 3 - 3 | 13 - 2 | 23 - 3 | 33 - 3 |
| 4 - 4 | 14 - 4 | 24 - 2 | 34 - 2 |
| 5 - 1 | 15 - 2 | 25 - 1 | 35 - 3 |
| 6 - 4 | 16 - 1 | 26 - 2 | 36 - 4 |
| 7 - 3 | 17 - 2 | 27 - 3 | 37 - 2 |
| 8 - 2 | 18 - 3 | 28 - 4 | 38 - 4 |
| 9 - 1 | 19 - 1 | 29 - 2 | 39 - 2 |
| 10 - 3 | 20 - 2 | 30 - 2 | 40 - 4 |

(ලකුණු 40)

## II පත්‍රය පිළිතුරු

1. (i) (අ) ප්‍ර - රකාරාංශය (ආ) රු - පාපිල්ල (ii) (අ) දුනු + අ (ආ) ළිඳ + වතුර

(iii) (අ) ගොස් (ආ) කරත්ම (iv) (අ) එළිසමය (ආ) අමුණන

(v) (අ) දරුවන් තම අභිමතය පරිදි කටයුතු කරති'යි දෙමාපියෝ සිතූහ.

(ආ) මෙවර විභාගයට ඉදිරිපත් වූ සියලු ශිෂ්‍යයන් මවුබස විෂයය සමත් වී ඇත.

මෙවර විභාගයට ඉදිරිපත් වූ සියලු ශිෂ්‍යයෝ මවුබස විෂයය සමත් වූහ.

(vi) (අ) අඛණ්ඩ (ආ) පරාර්ථය

(vii) (අ) ඇතුළු වී යන අදහස (ආ) වන්දනා කළ යන අදහස

(උක්තාඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතුය.)

(viii) (අ) මූලික (ආ) ඇදහිලි / විමසිල්ලට

(ix) (අ) ඇතැම් වෙළෙන්දන් විසින් අවස්ථානුකූල ව භාණ්ඩ මිල ඉහළ දැමෙයි/දමනු ලබයි/දමනු ලැබෙයි.

(ආ) කම්කරුවා විසින් වැඩබිමට පැමිණි තම සේවා දායකයා හමුවන ලදී.

(x) (අ) අල්පේච්ඡ (ආ) අනන්‍යතාව (ලකුණු 2×10=20)

2. රචනාව
- සාරවත්භාවය මාතෘකාවද ඇතුළුව (ලකුණු 08)
- සංවිධානය, නිර්මාණාත්මකභාවය, හා ස්වීයත්වය (ලකුණු 12)
- ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම (ලකුණු 05) (මුළු ලකුණු 25)

3. සාරාංශය
- අන්තර්ගතය (ලකුණු 06) ■ වචන ප්‍රමාණය (ලකුණු 02)
- ශිල්පීය දක්ෂතා (ලකුණු 02)
- කෙතරම් දුර්වල සාරාංශයකට වුවද ලකුණු 02 ලබා දිය යුතුය. (මුළු ලකුණු 10)
- ප්‍රධාන අදහස්
- දැනට විද්‍යමාන පැරණිම සිංහල කෘතිය වන්නේ දසවන සියවසේ විසූ සිවුවන සේන රජතුමා විසින් ලියන ලද සියබස්ලකරයි.
- ඒ සඳහා මූලාශ්‍ර වූයේ දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයයි.
- කව්සිළුමිණ වැනි ගී කාව්‍ය සඳහා ද සියබස්ලකර මාර්ගෝපදේශ සපයා තිබේ.
- මූලාශ්‍ර කෘතියෙහි පූර්ණ පරිවර්තනයක් ය යන මතයෙන් බැහැරව මෙය වර්ණනා කළ හැකි වන්නේ කෘතිය සම්පාදනයේ දී සිංහල සංස්කෘතියක් බුදුදහමත් හා සබැඳියාවක් ඇති බැවිනි.
- මූලාශ්‍රයෙහි මෙන් ම මෙහි ද සර්ග තුනක් ඇතත් අනවශ්‍ය කාව්‍යබන්ධන දක්නට නැත.
- සිංහල භාෂාව පිළිබඳව අභිමානවත් විය හැකි කරුණු රැසක් මෙහි ඇතුළත්ය.

4. 1. දකුණු බ්‍රසීලයේ පැන්තනාල් පිටාරතැන්න ප්‍රදේශය
2. මිරිදිය තෙත්බිම්, කිවුල්දිය තෙත්බිම්, කරදිය තෙත්බිම්
3. උස්බිම් මත ඇද හැලෙන වැඩිපුර ජලය ගලා ඒමෙන් සිදුවන ගංවතුර විපත් පාලනය කිරීම
4. රැම්සාර් සම්මුතිය, 1975 වර්ෂය
5. ලොව මානව ශිෂ්ටාචාරයන් පවා මේ ඇසුරින් බිහි වී ඇති නිසා (ලකුණු 2×5=10)

5. ප්‍රායෝගික ලේඛනය
ආකෘතිය (ලකුණු 04) අන්තර්ගතය (ලකුණු 08)
ශිල්පීය දක්ෂතා (ලකුණු 03) (මුළු ලකුණු 15)

## III පත්‍රය පිළිතුරු

1. (i) (අ) වෛදේහ රජු (ආ) 4 වන පරාක්‍රමබාහු රජු
(ii) ගොසින් ගොසින් කටු අත්තේ අග — සේමා
ඉතින් ළඳේ කරවිල තිබ්බටු — සේමා
(iii) (අ) සව්සැප දෙන (සිතුමිණ) (ආ) රමොන් මැග්සෙසය
(iv) (අ) මැටිල්ඩා (ආ) ගී ද මෝපසං
(v) (අ) සිනිඳු බව (ආ) එස්.මහින්ද හිමි
මොළොක් හා පිරිසිදු බව
(vi) (අ) උග්ගසේනයන්ට (ආ) පාලි ධම්මපදට්ඨ කතාව
(vii) (අ) කේ.ජයතිලක මහතා (ආ) මහගමසේකර මහතා
(viii) (අ) දිව්‍ය ගාන්ධර්වයන්ට (ආ) කෝට්ටේ යුගය
(ix) (අ) සීගිරි කැටපත් පවුරේ ගී (ආ) විභීෂණ දෙවියන්ට
(x) (අ) සියබස්ලකර (ආ) කාව්‍යාදර්ශය (ලකුණු 2×10=20)

2. (i) (අ) කේවට්ටයන් මහෞෂධ වැන්දා යැයි සිතීම.
(ආ) මේ මිනිස් ලොව උපන් මිනිසුන්ගෙන් පහත් යැයි කෙනෙක් කළ නොකළ යුතු දෙයක් තිබේද එය ඔබ විසින් නොකළේ මොනවාද?
(ii) (අ) දොළක් දොළක් පාසා යල මහ දෙකන්නයට වගා කරන කුඹුරු ඇති බව.
(ආ) විලක් විලක් පාසා පිපුණු නෙළුම් මානෙල් හා සුදු නෙළුම් ඇති බව.
(iii) (අ) බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහිදී අඟුල්මල් තෙරුන් ඒ අසල සිටින බව දකුණත නගා පෙන්වීම.
(ආ) කොසොල් රජ බියපත් වැ වෙවුලා යාම/මහජනයා බියපත්ව කඩු පළග දමා දිවීම/දොරවල් වසා අගුලු දැමීම.
(iv) (අ) ශක්‍ර දේවේන්ද්‍රයාගේ උපදෙස් ලැබීම
(ආ) අධිෂ්ඨාන බලයෙන් සතුට ඇති කරන
(v) (අ) ගිලන් බව කෘෂවීම ඉකි ගසමින් ගලායාම
(ආ) ජීවිතය දුෂ්කරය කියා හැර යා නොයා යුතුය. (ලකුණු 4×5=20)

**3 සහ 4 ප්‍රශ්න සඳහා,**
උචිත උදාහරණ 04ක්, එක් කරුණකට 02 බැගින් ඇත්නම් ලකුණු 04
කරුණු සඳහා ලකුණු 11 (මුළු ලකුණු 15×2=30)

**5, 6 සහ 7 ප්‍රශ්න සඳහා,**
උචිත උදාහරණ සඳහා ලකුණු 03
කරුණු සඳහා ලකුණු 07
(මුළු ලකුණු 10)